1/12 උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනයක් ස්ථාපිත කෙරේ.

- ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය (NIBM) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම මගින් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගෙන ඇත.

- මෙම ආයතනය මගින් වසරකට ශිෂ්‍යයන් 10,000 ක් පමණ පුහුණු කරනු ලබයි.

- ජාතික විශ්වවිද්‍යාල පද්ධතියෙහි පවත්නා සීමාවන් හේතු කොට ගෙන විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබා ගත නොහැකි සිසුන් හට පහසුකම් පුළුල් කරනුවස් එන්.අයි.බී.එම් ආයතනය යටතේ ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව විද්‍යායතනයක් නමින් නව ආයතනයක් ආරම්භ කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබිණ.

- මෙම ආයතනයට උපාධි සහ වෙනත් උසස් අධ්‍යාපනික සහතික පිරිනැමීමේ බලතලද හිමි වේ.

- යෞවන කටයුතු සහ නිපුණතා සංවර්ධන අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මැතිතුමාගේ යෝජනාවකට අනුව මෙම ආයතනය සඳහා නාගරික සංවර්ධන අධිකාරියට අයත් හෝමාගම, පිට්පන ප්‍රදේශයේ අක්කර 50 ක ඉඩමක් පවරා දෙනු ලැබේ.

- ජාතික මට්ටමේ අංග සම්පූර්ණ උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස ස්ථාපිත කිරීමට අපේක්ෂිත මෙම ස්වයං - මූල්‍ය ආයතනය වෙත ප්‍රාග්ධනය ගොඩනැගීම සඳහා දේශීය හා විදේශීය බැංකුවලින් රුපියල් බිලියන 3.5 ක පහසු ණයක් ලබා ගැනීම අපේක්ෂා කෙරේ.

2/15 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය ලබා ගැනීම සඳහා තවදුරටත් කටයුතු කිරීමට තීරණය කරයි.

 2018 පොදුරාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල සත්කාරක රට ලෙස ශ්‍රී ලංකාව තෝරා ගැනීම සඳහා අයදුම්කර ඇත.

 මේ සඳහා අවශ්‍ය අභිලාෂය (ඊඕඅයි) පළ කිරීමේ ප්‍රකාශයක් රජය විසින් ඉදිරිපත් කර තිබේ.

 හම්බන්තොට නගරය මේ සඳහා තෝරා ගැනීමට යෝජිත අතර ක්‍රීඩා අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාගේ යෝජනාවක් මත මෙහි මූලික සංවිධාන කටයුතු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබිණ.

3/16 ලාහුගල නීලගිරි මහ සෑය සංරක්ෂණයට පියවර

 අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල වන රක්ෂිතය තුළ පිහිටි මෙම සෑය නැගෙනහිර පළාතේ මෙතෙක් සොයාගෙන ඇති විශාලතම චෛත්‍ය ලෙස හඳුනාගෙන ඇත.

 පසුගිය වසර 30 ක කාලයක් මුළුල්ලේ පැවති ත්‍රස්ත තර්ජනය හේතුවෙන් කිසිදු සංරක්ෂණයක් මෙහි සිදුකිරීමට නොහැකි විය.

 එහෙයින් ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය ජගත් බාලසූරිය මහතාගේ යෝජනාවක් අනුව නීලගිරි මහ සෑය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ ඇරඹීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

4/20 හම්බන්තොට සහ නුවරඑළිය දිසා මහ රෝහල් යුරෝ මිලියන 86.49 ක නෙදර්ලන්ත ආධාර

යටතේ සංවර්ධනය කෙරේ.

 ශ්‍රී ලංකාවේ ආර්ථික හා සංවර්ධන කටයුතු පිණිස සහනදායි ණය පදනම යටතේ අධාර සැපයීමට නෙදර්ලන්ත රජය කැමැත්ත ප්‍රකාශ කර ඇත.

 ඒ අනුව නෙදර්ලන්තයේ රබෝ බැංකුව හරහා හම්බන්තොට හා නුවරඑළිය දිසා මහ රෝහල් දෙක දියුණු කිරීම සදහා සෞඛ්‍ය අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා කළ යෝජනාවට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබිණ.

 මෙම රෝහල් දෙකට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම් ඇතුළු වෛද්‍ය උපකරණ සැපයීම නෙදර්ලන්තයේ සේවා සැපයුම්කරු වන එන්රග් නෝනියස් සමාගම වෙත පැවරීමට තීරණය කරන ලදී.

5/30 ලිබියානු රජය සමග අවබෝධතා ගිවිසුම් 03 ක් අත්සන් කිරීම සදහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබේ.

 ශ්‍රී ලංකාව ලිබියාවේ විශාල වෙළෙද සහකරු වන අතර ලිබියාවට අවශ්‍ය තේවලින් 90 % ක් පමණ ආනයන කරනු ලබන්නේ ශ්‍රී ලංකාවෙනි.

 නොබැදි ජාතින්ගේ පුරෝගාමී රට වශයෙන් ශ්‍රී ලංකාව සහ ලිබියානු රජය අතර ඉතා සුහද මිත්‍රත්වයක් පවතින අතර ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති සදහා ඇමරිකානු ඩොලර් මිලියන 500 ක මූල්‍ය අධාර පැකේජයක් ලබා දීමට ලිබියානු රජය එකග වී ඇත.

 ජනාධිපතිතුමා ලිබියාවේ සංචාරය කළ අවස්ථාවේදී එකග වූ මෙම ණය පහසුකම් යටතේ උතුරු නැගෙනහිර සංවර්ධනය, මහා මාර්ග සංවර්ධනය, සන්නිවේදන හා සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනය සදහා අධාර ලබා ගැනීම පිණිස ලිබියානු රජය සමග 2009 දී අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම් 03 කට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබිණ.

6/32 කොළඹ නගරයේ අලුතනේ තරු පහේ හෝටලයක් සහ බහුකාර්ය සංකීර්ණයක් ඉදිකිරීමේ ආයෝජන ව්‍යාපෘතියට අනුමැතිය

 ගාලු මුවදොර යුධ හමුදා මූලස්ථාන පරිශ්‍රයේ සංවර්ධන කටයුතු ආරම්භ කර ඇති ෂැන්ග්‍රිලා සංචාරක හෝටල් ව්‍යාපෘති ඉඩමට යාබදව ඇ.ඩො.මි 500 ක ආයෝජනයක තවත් නව ආකර්ෂණීය ආයෝජනයක් සිදු කිරීමට යෝජිතයි.

 කොළඹ නගරය මධ්‍යම ආදායම් වාණිජ නගරයක් ලෙස සංවර්ධනය කිරීම රජයේ අරමුණයි.

 ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ යෝජනාවක් අනුව චයිනා නැෂනල් ඒරෝ ටෙක්නොලොජි කෝපරේෂන් විසින් හදුනාගත් මෙම ප්‍රදේශයේ තරුපහේ හෝටලයක් හා බහු කාර්යය සංකීර්ණයක් ඇති කිරීමේ අයෝජන යොජනාවලියට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාදෙන ලදී.

 ඒ අනුව ආරක්ෂක අමාත්‍යාංශ පරිශ්‍රයේ යෝජිත මෙම ආයෝජන දෙකෙ මගින් ඇමරිකානු ඩොලර් මිලියන 1000 ක සෘජු ආයෝජනයක් සිදු කරනු ඇත.

7/33 දැනට පවත්නා අයහපත් කාලගුණික තත්ත්වය පිළිබද අමාත්‍ය මණ්ඩලය දීර්ඝ වශයෙන් සාකච්ඡා කරයි.

 රටේ දිස්ත්‍රික්ක ගණනාවකට බලපාන අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් ඊයේ වනවිට පවුල් 254,637 කට අයත් පුද්ගලයන් 954,204 ක් පීඩාවට පත්ව ඇති අතර 18 දෙනෙකු මරුමුවට පත්වී ඇති බවද වාර්තා විය.

 සම්පූර්ණයෙන් විනාශ වී ඇති නිවාස ගණන 1727 කි.

 අර්ධ වශයනේ විනාශ වී ඇති නිවාස ගණන 12152 කි.

 පුද්ගලයන් 195,000 කට වැඩි ගණනක් කදවුරුවල සිටිති. වැඩිම බලපෑම සිදුව ඇත්තේ මඩකලපුව හා අම්පාර දිස්ත්‍රික්කවලටයි.

 මමෙ ආපදාවට පත්වූවන් වතෙ සහන සැලසීම පිණිස ඊයේ වනවිට රුපියල් මිලියන 80 කට වැඩි ප්‍රමාණයක් දිස්ත්‍රික් ලකේම්වරුන් වතෙ නිදහස් කර ඇති අතර හදිසි මිලදීගැනීම් සදහා තවත් මිලියන 20 ක් වැයකර ඇති බව ආපදා කළමනාකරණ අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමා අමාත්‍ය මණ්ඩලය වතෙ කරුණු ඉදිරිපත් කළේය.

 මමෙ අසාමාන්‍ය කාලගුණික තත්ත්වය නිවර්තන ශාන්තිකර සාගරයේ 2010 අප්‍රලේ් සිට පවතින දැඩි ලා-නිනා කාලගුණික තත්ත්වය නිසා ඇති වූවක් යැයි විශ්වාස කරේ.

 පීඩාවට පත් ජනතාවට අවශ්‍ය මූලික පහසුකම් සියල්ල සැපයීම ජනපති නියමයනේ දැනටමත් ආරම්භකර ඇත.

 විපතටපත් ජනතාවගේ ජීවනෝපාය, කෘෂිකාර්මික කටයුතු මනේම අදාළ ප්‍රදශේයන්හි විනාශයට පත්ව ඇති වැව් අමුණු පිළිසකර කිරීම ඇතුළුව සියලු යටිතල පහසුකම් යථා තත්වයට පත් කිරීම සදහා අවශ්‍ය සියලු මහෙයුම් කාර්යයන් වහා දියත් කරන ලසෙ උපදසේ දුන් ජනාධිපතිතුමා මේ සදහා අවශ්‍ය ප්‍රතිපාදන කිසිදු බාධාවකින් තරොව මහා භාණ්ඩාගාරය වතින් ලබාදනෙ බවට පරොරොන්දු විය.

 ගංවතුරනේ පීඩාවට පත් ජනතාවට කඩිනම් සහන සැලසීම සහ විනාශ වූ යටිතල පහසුකම් යළි ගාඩනැගීම සදහා වහා අවශ්‍ය පියවර ගැනීම පිළිබදව ජනාධිපතිතුමා වතෙ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් ප්‍රසංශා පළ කළහ.

8/26 දැයට කිරුළ 2011ට සමගාමීව මරොණරාගල ජල සැපයුම පුළුල් කරේ.

- දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සමගාමීව බුත්තල ජල සම්පාදන යෝජනා ක්‍රමය වැඩි දියුණු කිරීමට තීරණය කර තිබෙනවා.

- මොණරාගල දිස්ත්‍රික්කයේ නක්කල - මැදගම , බුත්තල - කතරගම මාර්ගය, බුත්තල - බඩල්කුඹුර මාර්ගය, කුඹුක්කන - ඔක්කම්පිටිය මාර්ගය, බුත්තල - හළෙගම මාර්ගය හා තණමල්විල - උඩවලව මාර්ගයට ජලය සැපයීම සඳහා දැනකට ජලය ඝන මීටර් 3700ක් නිපදවීම අපේක්ෂා කෙරේ.

- ජල සම්පාදන හා ජලපවාහන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමාගේ යෝජනාවකට අනුව ඉහත ප්‍රදේශයන්ට අවශ්‍ය පහසුකම් සැපයීම ඇතුළුව බුත්තල ජල සම්පාදන ක්‍රමයේ වැඩි දියුණුව සඳහා රු.මිලියන 175ක ප්‍රතිපාදනයක් වෙන් කිරීමට තීරණය කළේය.

මහාචාර්ය ආරියරත්න ඇතුගල
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්